ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.

VII සභා වාරය හතළිස් හත්වන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.
දිනය : 2022.01.11.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:
01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
04..ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය.
20.ගරු ප්රාදේශීය සභා මන්ත්‍රිනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
22.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:
01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.

නිලධාරි සහභාගීත්වය:
01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ හතළිස් හත්වන සභාව සඳහා පැමිණි මන්ත්‍රී මණ්ඩලයත්, මාධ්‍යවේදී මහත්ම මහත්මීන් සහ ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීනුත් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2021.12.21. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් 2021.12.21. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

" අසනීප තත්ත්වයෙන් පසු වූ බැවින් ගරු උප සභාපති, එච්.එම්.ඩබ්.කේ. බන්දුසේන මැතිතුමා පසුගිය මාසික මහ සභාවට පැමිණියේ නැහැ. එබැවින් මා විසින් වෙනත් කරුණු අවස්ථාවේ දී, එතුමාගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාව ඉදිරිපත් කලා. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කළා. ඒ බව සභා වාර්තාවේ සටහන් වී නොමැති බැවින් " එම සටහන ඇතුළත් කර සංශෝධනය විය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ.ආර්. ජයානන්ද මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

වෙනත් කරුණු පිටු අංක 09 හි "අවස්ථා දෙකක දී අනතුරුදායක ගස් ඉවත් කිරීමට ඉල්ලීම් කර මුදල් ගෙවා ඇති අතර සභාව විසින් අනතුරුදායක බව ඉවත් කරන ලෙස දන්වා යවා ඇතත්, අදාල පාර්ශව විසින් ගස් කපා අනතුරුදායක බව ඉවත් කර නැහැ. අනතුරක් වූවොත් සභාවේ කීර්ති නාමයට ගැටලුවක් බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන්න." යන සටහන,

"අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කල යෝජනාවට අදාල ඉල්ලුම්කරුගේ නම සභා වාර්තාවේ සටහන් වී නොමැති බැවින්, ඩබ්.කේ.ඩී. මේරියන් නිලන්ති ලෙසට නම ඇතුළත් කර " සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

වෙනත් කරුණු පිටු අංක 09 හි "ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල විධායක ඉංජිනේරු කාර්යාලය විසින් මාර්ග සංවර්ධනය කිරීමේ දී මාර්ගයන්හි උරහිස කොන්ක්‍රීට් කිරීම නිසි ප්‍රමිතියකින් තොරව පවතින නිසා එම මාර්ගයන්හි කෝර්කටින් පරීක්ෂාවක් සිදු කර ගෙවීම" සුදුසු බවට ප්‍රකාශ කල බව සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව 2021.12.21. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

(i). මාසික මහ සභා රැසවීමට වෙනත් කරුණු අවස්ථාවේ දි මන්ත්‍රීවරුන් වරින් වර නැගි සිටිමින් යෝජනා ඉදිරිපත් කරනු ලබයි. ලිඛිත යෝජනාවක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන එම යෝජනා සාකච්ඡාවට බඳුන් වන අතර, ක්‍රියාත්මක කිරිමට විෂය නිලධාරීන්ට යොමු කිරිමට සිදු වන බැවින්, මෙම යෝජනා සම්බන්ධ ඉදිරි පියවර ගැනීමේ දී බාධාවන් සිදු වේ. එබැවින් ඉදිරියේ දී මාසික මහ සභාවට යෝජනා ඉදිරිපත් කිරීමේ දී කල්වේලා සහිතව එම යෝජනා ලිඛිතව ලේකම් වෙත ලබා දීමට කාරුණික වන්න.

(ii). පසුගිය දිනක ඇල්ලේඅරාව පොදු සුසාන භූමිය තුල නාඳුනන මළ සිරුරක් මිහිදන් කිරිමට සිදුවුණා. එම මෘත දේහය මිහිදන් කිරීමට මිණී පෙට්ටියක් නොමැතිව සිටියත්, එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමාගේ මැදිහත් වීම මත අනුර ජයතුංග මල් ශාලාවේ අධිපතිතුමන් විසින් නොමිලයේ මිණී

පෙට්ටියක් ලබා දීමට කටයුතු කලා. ඒ අධාරයෙන් මෘත දේහය ගෞරවාන්විතව මිහිදන් කලා. එහෙත් මිණී පෙට්ටියක් නොමැතිව මෘත දේහය තැන්පත් කල බවට මාධ්‍ය වේදී මහතෙක් විසින් පුවත් පතකට වාර්තාවක් ඉදිරිපත් කර තිබුණා. මේ පිළිබඳව මුහුණු පොත මාධ්‍ය හරහා විවිධ මත ඉදිරිපත් වී තිබුණා. එම වාර්තාව නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස මාධ්‍යවේදී මහතාටත් එම පුවත්පතටත් දන්වා සිටිනවා.

එම අවස්ථාවේ දී ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා නැගී සිටිමින් අදහස් දක්වමින්,
පුවත්පත් වාර්තාකරණයත් සමඟ නොමිලයේ ලබා දුන් මිණීපෙට්ටියට මුදල් ගෙවන බව මේ සම්බන්ධයෙන් මූලිකත්වය ගෙන කටයුතු කල වසමභාර ග්‍රාම නිලධාරිනිය ප්‍රකාශ කලා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඉදිරියේ දී ක්‍රියාත්මක කිරිමට නියමිත සංවර්ධන වැඩසටහන් පිළිබඳව වනජීවි සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාකච්ඡාවක් කැඳවා තිබෙන බැවින්, ඒ සඳහා සහභාගී වීමට මා නික්ම යා යුතුයි. එබැවින් න්‍යායපත්‍රානුකූලව සභාව ඉදිරියට මෙහෙය වීමට ගරු උප සභාපති එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාට මූලාසනය භාරදීමට කටයුතු කරන අතර මා නික්ම යාමට පෙර මාගෙන් විමසිය යුතු ප්‍රශ්න පවතීනම් ඒ සඳහා අවස්ථාව ලබා දීමට මා කැමතියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් හල්ගහවෙල ගැට්ටපාන ප්‍රදේශය ආශ්‍රිතව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බදුල්ල කොළඹ මාර්ගය දැඩි අවධානම් සහගත සහ අනතුරුදායක තත්ත්වයක් උද්ගතව තිබුණා. එම අනාරක්ෂිත බව ඉවත් කිරිමට පියවර ගන්නා ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඒ බව දන්වා යවන ලෙස මා විසින් පසුගිය සභාවාරයක දී යෝජනාවක් ඉදිරිපත් කලා. මේ අවස්ථාව වන විට එම ස්ථානය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රතිසංස්කරණය කරමින් පවතිනවා. ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාටත්, මාර්ග සංවර්ධන අධිකාරියටත් ස්තුතිය ප්‍රකාශ කිරිමට මා මෙය මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
ගියවර සභාවාරය වනවිට ඉඩම් හිමිකරු විසිනුත්, මෙවර සභාවාරය වන විට ගම්වාසීනුත් නෙල්ලිවල මාර්ගය සංවර්ධනය කිරිම පිළිබඳව ලිපි යොමු කර තිබෙනවා. එම කොට්ඨාසයභාර මන්ත්‍රීතුමාත් මන්ත්‍රීතුමියත් සභාවේ රැඳී සිටිනවා. මෙම මාර්ගය සංවර්ධනය කර අවසන්ද? සභාවක් ලෙස මේ සඳහා තින්දු ගෙන තිබෙනවාද? මේ සම්බන්ධයෙන් සාධනීය පිළිතුරක් ලබා ගත හැකි ද?

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මෙම මාර්ග ගැටලුව විසඳාලීම සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මමත් කොට්ඨාශයභාර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමියත්, කාර්මික නිලධාරි මහතාත්, ඉඩම් හිමිකරුත් සමග සහභාගී වී ස්ථානිය පරීක්ෂාවක් සිදු කළා. එම ප්‍රදේශයේ පවතින ඉඩම්වල වටිනාකම සලකා බලා ඉඩම්හිමිකරුට යම් සාධාරණ මුදලක් ලබා දීමට ගම්වාසින් කැමැත්ත පල කළා. මෙම ගැටලුව විසඳාලීම සඳහා තව දුරටත් සාකච්ඡා කරමින් පවතිනවා.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හල්පේ මුත්තෙට්ටුවේගම කොස්ගම ප්‍රදේශය තුල මැණික් ලබා ගැනීමට තැත් කිරීම නිසා පරිසර හානියක් සිදු වී ඇති බව මාධ්‍ය මඟින් ප්‍රචාරය වුණා. එම ප්‍රදේශයේ කොටසක් බදුල්ල පළාතට මායිම්වත් අනෙක් කොටස සබරගමුව පළාතටත් මායිම් ව බෙදී පවතිනවා. මාස අටක් තුල මෙම පරිසර හානිය සිදු වෙලා. ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කිසිදු පරිසර හානියක් සිදුවීමට ඉඩ නොතබන බව ඔබතුමා පසුගිය සභාවාරයකදී ප්‍රකාශ කලා. දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු ගරු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමිය සහ ඔබතුමාත් ඊයේ දින එම ස්ථානය පරීක්ෂා කරනවා දුටුවා. ව්‍යාපාරිකයන්ට විරුද්ධ නොවුවත්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව ලෙස මේ ගැටලුව දෙස බැලිය යුතුයි. ගම්වාසීන්ට යම් සාධාරණයක් සිදු විය යුතුයි. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව ලෙස මේ සම්බන්ධයෙන් ගන්නා තීන්දුව කුමක්ද?

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
සියලු පාර්ශව සමඟ සාකච්ඡා කිරිම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අනු කමිටුවක් කැඳවා තිබෙනවා. එම කමිටුවට ප්‍රාදේශීය ලේකම්තුමිය, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මමත්, කොට්ඨාස භාර මන්ත්‍රීවරුන් දෙපලත්, වන සංරක්ෂන දෙපාර්තමේන්තු නිලධාරින්, ජාතික මැණික් සංස්ථාවේ නිලධාරින් සහ ගම්වාසින් සහභාගී විමට නියමිතයි.
නීත්‍යානුකූල අයිතියක් නොමැතිව ඇළ හරස්කර බැම්මක් සකස් කර තිබූ නිසා බැම්ම ඉවත් කරන ලෙස දැනුවත් කලා. ගම්වාසීන්ට තර්ජනය කිරිම, හිරිහැර නොකරන ලෙසට දැනුම් දුන්නා. එවැනි ක්‍රියාවන් වලදී නිත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා ලෙසට පොලිසියට දැනුම් දුන්නා. ගම්වාසීන් ගමන් කරන මාර්ගය වසා දමා නැහැ. එහෙත් ඔවුන්ගේ වැඩපිළිවෙල නිසා මාර්ගය අවහිරවී වි තිබුණා. ගම්වාසීන්ට මාර්ගය තුල ගමන් කිරීමට හැකි ආකාරයට සකස් කිරිමට වහාම පියවර ගන්නා ලෙස දැනුවත් කලා.
ගම්වාසීන්ට හිරිහැර නොවන පරිදි, විශේෂයෙන් පරිසරයට අවම ලෙස හානි වන පරිදි, ව්‍යාපාරිකයන්ට තම ව්‍යාපාරය පවත්වාගෙන යාමට හැකි පරිදි පතල් කැණීම් කටයුතු සිදු කිරිමට අවස්ථාව ලබා දීම සුදුසු බැවින් ඒ සඳහා උපදෙස් ලබා දෙනවා.

එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා නැවතත් අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමන්ලා කොට්ඨාසය නියෝජනය කරන බැවින් මේ සඳහා කැඳවනවාද? මේ සඳහා සහභාගී වන්නේ ඔබතුමා පමණ ද?

නැවතත් ගරු සභාපතිතුමා ඒ පිළිබඳව අදහස් දක්වමින්,
ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් කමිටුවට අදාල පාර්ශවයන් කැඳවීමට කටයුතු කර තිබෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා නැවතත් අදහස් දක්වමින්,
ගම්වාසීන් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ඊළඟ ප්‍රශ්නය වන්නේ අලුත්නුවර උඩඅරාව මාර්ගය පිළිබඳවයි. එම මාර්ගයේ මැණික් ලබා ගැනීම සඳහා පතල් කැණීම් කටයුතු සිදු කලා. එහෙත් මැණික් ඉල්ලම් ලබාගෙන මාස කිහිපයක් ගත වුවත් එම මාර්ගය නිසියාකාරයෙන් නිමකර නැහැ. පතල් කැණීම් කටයුතු සිදු කිරිමට පෙර ටෙන්ඩර් ක්‍රියාවලිය පිළිබඳව අදහස් ප්‍රකාශ කල අවස්ථාවේ දී මාර්ගය සංවර්ධනය කිරීමට සිදුවන ප්‍රමාදවීම් වලදී ඒ සඳහා සභාවට අයකිරීම් සිදු කරන බව දන්වා සිටියා. විද්‍යානුකූලව මාර්ගය සංවර්ධනය කර අවසන් බව ඔබතුමා ලිපි මඟින් දන්වා යවා තිබුණා. එහෙත් මාර්ගය නිසියාකාරව නිම කර නැහැ.

ගරු සභාපතිතුමා ඒ පිළිබඳව අදහස් දක්වමින්,
කාර්මික නිලධාරි මහතාගේ උපදෙස් හා නිර්දේශ අනුව මාර්ගය පෙර පැවැති ආකාරයට වඩා ක්‍රමවත්ව සංවර්ධනය කර තිබෙනවා. එය ගමට සිදු වූ වාසිය බව ද ප්‍රකාශ කරන ලදි. සභාවට යෝජනා සහ අදහස් ඉදිරිපත් කිරීමේ දී එම යෝජනා ලිඛිතව හා සාක්ෂි සහිතව ඉදිරිපත් කරන්න.

එම අවස්ථාවේ දී නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
ගම නියෝජනය කිරීමට මන්ත්‍රීවරුන් ලෙස අපි මෙහි රැඳී සිටින බවත්, මගේ අයිතිය වෙනුවෙන් සහ ගම වෙනුවෙන් අදහස් ප්‍රකාශ කල බවත් යෝජනාව ලිඛිතව ලබා දීමට අවශ්‍ය නොවන බවත්, මාර්ගය සංවර්ධනයට දින ප්‍රමාද වීම නිසා සභාවට අයවිය යුතු මුදල් අය කර ගැනීමට ක්‍රියා කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි. මැතිවරණ කොමිෂන් සභාව විසින් තෝරාපත් කල සභිකවරයාත්, මැතිවරණ කොමිෂන් සභාව විසින් තෝරා එවන ලද සභිකවරයාත් අතර පවතින වෙනස කුමක් ද? එයින් සභාවට වන වාසිය කුමක් ද? සභිකවරුන්ට වෙන වෙනම වරප්‍රසාද පවතිනවා ද ?

එම අවස්ථාවේ දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මැතිවරණයේ දී කොට්ඨාශය ජයග්‍රහනය කල නිසා කොට්ඨාස මන්ත්‍රීවරයා ලෙස හැඳින්වෙනවා. සභිකවරු දෙපිරිසටම සම අයිතිවාසිකම් පවතින බවත් එහෙත් මැතිවරණ කොමිෂන් සභාව විසින් තෝරා එවා ඇති

සභිකවරුන් කොට්ඨාස මන්ත්‍රීවරයා ලෙස හැඳින්විය නොහැකි බවත්, සභාව තුල සභිකවරුන් ට වෙන වෙනම වරප්‍රසාද නොපවතින බවත් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වමින්,
අලුත්නුවර උඩඅරාව මාර්ගයෙන් මැණික් ඉල්ලම් ලබා ගැනීමට කටයුතු කලත් මාර්ගය නිසි පරිදි සංවර්ධනය කර නොමැති බව ගම්වාසින් ප්‍රකාශ කරනවා. එබැවින් එම මාර්ගය සංවර්ධනය කිරිම පිළිබඳව ඔබතුමා නැවත පරික්ෂාවට ලක් කරන්න.

එම අවස්ථාවේ දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
නැවත පරික්ෂා කිරීමට විරෝධතා ඉදිරිපත් වී නැහැ. අදාල තොරතුරු ලිඛිතව ලබා දිමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
කොස්ගම මාර්ගය සම්බන්ධයෙන් නීතිය අභිබවා කටයුතු කරන පුද්ගලයා කවුදැයි හොයා ගන්න පුළුවන් ද? එසේ කටයුතු කරන පුද්ගලයා වෙඩි කනවද මෙය නවත්වනවාදැයි ගම්වාසීන්ගෙන් විමසා තිබෙනවා. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමිය නිහඬයි. මේ පිළිබඳව සාමාන්‍ය පුද්ගලයෙක් කටයුතු කළානම් නීතිය අනුව කටයුතු සිදු කිරිම වෙනස්. මෙම ක්‍රියාවලියට සම්බන්ධ වී සිටින්නේ කවුදැයි ඔබතුමා දන්නවා. ඔබතුමා ඔහු පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මැණික් පතලේ නීත්‍යානුකුල අයිතිකරු ලෙස බලපත්‍ර ලාභියා ඉදිරිපත් වෙනවා. එලෙස ඉදිරිපත්වන පුද්ගලයා නීත්‍යානුකූල අයිතිකරු වේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
පැමිණිල්ල ඉදිරිපත් කිරීමට ගිය අවස්ථාවේ දී ඔවුන්ට අර පොලීසියට යන්න මේ පොලීසියට යන ලෙස පවසා තිබෙනවා. ඒ අනුව රටේ නීති දෙකයි. ගම්වාසීන් යනු අහිංසක මිනිස්සු. සිදු වූ විනාශයට වග කියන්නේ කවුරුන් ද?

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මේ පිළිබඳව සාකච්ඡා කිරීමට 2022 01.17 වෙනිදා රජයේ නිවාඩු දින නොසලකා කමිටුවක් කැඳවා තිබෙනවා. කමිටුව රැස් වී නිර්දේශ ලබා දිමට නියමිත බැවින් එම නිර්දේශ අනුව සිදු වූ විනාශයේ වගකීම සියලුම නිලධාරින්ට පැවරෙනවා. අදාල සිදුවීමට සම්බන්ධ අයගේ තරාතිරම අදාල වන්නේ නැහැ. අපි ගෞරවනිය මන්ත්‍රීවරුන් බැවින් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී අරයා කිව්වා මෙයා කිව්වා ලෙසට නොව, සාක්ෂි ඇතිව ඉදිරිපත් කරන්නේ නම් නීතිය ක්‍රියාත්මක කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල පහසුකම්වලට හානි සිදු වෙලා. මිනිසුන් බිය වැද්දිම්, තර්ජනය කිරීම් සිදු වෙලා ඒ පිළිබඳව පොලිසියට දන්වා තිබුණත් ක්‍රියාමාර්ග නොගැනීම නිසා ගම්වාසීන් ප්‍රාදේශීය සභාවට පැමිණෙන බව ප්‍රකාශ කරනවා. මේ පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල මැතිතුමාටත් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවටත් දැනුම් දිලා තිබෙන බව ගම්වාසින් ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
මාධ්‍ය තුලින් ඉදිරිපත් කල ප්‍රකාශයන් මගින් අපි තොරතුරු දැනගත්තා. ගමේ පොලීසියට පැමිණිලි ඉදිරිපත් කලත්, රාජකාරි ක්‍රියාත්මක කලේ නැත්නම් බලංගොඩ පොලීසියේ සහකාර පොලිස් අධිකාරිතුමාට පැමිණිලි ඉදිරිපත් කරන්න තිබුණා.,

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,

ගමේ තියෙන පොලිසියෙන් සාධාරණය වෙන්නැත්නම් අර පොලිසියට යන්න මේ පොලීසියට යන්න කියනවා. ගම්වාසින්ට වැඩ තිනෙවා හැම තැනම ඇවිදින්න වෙලාවක් නෑ. ඔබතුමා එක රටයි එක නීතියයි කියාල පටන් ගත්තත්, මොන කතාව කිව්වත් රටේ එක නිතියක් නෑ. පැහැදිලිවම බයයි. රාජ්‍ය සේවකයෝ බයයි. අනිත් අය යටින් උදව් කරනවා.

එම අවස්ථාවේ දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
බල ප්‍රදේශය තුල මාස අටක් තිස්සේ පතල් කැණීම් කටයුතු සිදු කලත්, ඔබතුමා ඒ පිළිබඳව දන්නේ නෑ. ගම්වාසීන් විසින් මේ පිළිබඳව කොට්ඨාස මන්ත්‍රීවරුන් දෙපල දැනුවත් කර තිබෙනවා. එහෙත් මාධ්‍ය මඟින් ප්‍රවෘත්ති විකාශය වූ පසුව ඔබතුමන්ලා එම ස්ථානය බලන්න ගියා.

අදාල තොරතුරු දැනගත් විගසම එම ස්ථානය පරීක්ෂාවට ලක් කල බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

පෙ.ව. 10.30 ට ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා ගරු සභාවෙන් නික්ම ගිය බැවින් සභාව ඉදිරියට මෙහෙය වීම සඳහා මුලාසනයේ කටයුතු ගරු උප සභාපති එච්.එම්.ඩබ්.කේ. බන්දුසේන මැතිතුමාට භාර දෙන ලදී.

## (03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මොරහැල - අමුපිටිය ප්‍රවේශ මාර්ගයේ අතුර මාර්ගයක් වන කුඹල්මුල්ල - නළුවෙල මාර්ගයේ කාණු පද්ධතියට වැටි ඇති පස් ඉවත් කරවා ගැනීම සම්බන්ධයෙන් කුඹල්මුල්ල, මොරහැල ලිපිනය සඳහන් කේ.කේ. ශාන්ත කුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු උප සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
මද්දේතලාව ග්‍රාම නිලධාරි වසමේ කුඹල්මුල්ල ග්‍රාමයේ මොරහැල - අමුපිටිය ප්‍රවේශ මාර්ගයේ අතුරු මාර්ගයක් වන කුඹල්මුල්ල - නළුවෙල මාර්ගයේ කාණු පද්ධතියට පස් වැටිම හේතුවෙන් කාණු පද්ධතිය අවහිර වී තිබෙනවා. මාර්ගය අසල ඉඩම් හිමිකරු පස් ඉවත් කිරිමට ඉඩ දෙන්නේ නැහැ. ගම්වාසීන් ශ්‍රමදානයක් මඟින් පස් ඉවත් කිරිමට කැමැත්තෙන් සිටිනවා. කාර්මික නිලධාරි මහතා යොමු කර ස්ථානීය පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරන්න.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,
කාර්මික නිලධාරි මහතා ලවා ස්ථානිය පරීක්ෂාවක් සිදු කරවා කාණුවට වැටී ඇති පස් ඉවත් කිරිමට අවස්ථාව සලසා දෙනවා.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ර/ කරගස්තලාව පාසල අසලින් හිරිකටුඔය ඉහළ ගම්මානයට පිවිසෙන මාර්ගය සංවර්ධනය කර දෙන ලෙසට පාසල් ළමුන්ගේ ඉල්ලිම පරිදි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු උප සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාගේ කොට්ඨාශයට මෙම මාර්ගය අයතියි. එහෙත් මෙම ඉල්ලිම මාවෙත ඉදිරිපත් කල බැවින් සභාවට ඉදිරිපත් කලා. ගම්වාසීන්ගේ පහසුව සඳහා මෙම මාර්ගය සංවර්ධනය කිරිමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,
මෙම මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කරන ලෙසට පළාත් මාර්ග අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

## (04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - කිසිවක් ඉදිරිපත් වී නැහැ.

(05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ඇල්ලේඅරාව නාකැටිය වත්ත ජල යෝජනා ක්‍රමයේ දැනට පවතින ජල පොම්පය වසර හයක් පමණ පැරණි ජල පොම්පයක් බැවින් නිරන්තර ආපදාවන්ට ලක් විම නිසා ජල ජල සැපයුම අඛණ්ඩව යාවත්කාලිනව පවත්වාගෙන යාම සඳහා නව ජල පොම්පයක් මිලදී ගැනීමත්, දැනට පවතින ජල පොම්පය අලුත්වැඩියා කිරීමටත් අදාල ව ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ඇල්ලෙඅරාව නාකැටියවත්ත ජල යෝජනා ක්‍රමය සඳහා නව ජල පොම්පයක් මිලදී ගැනීම හා පැරණි ජල පොම්පය අලුත්වැඩියා කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ඇල්ලේඅරාව නාකැටියවත්ත ජල යෝජනා ක්‍රමය සඳහා නව ජල පොම්පයක් මිලදී ගැනීමේ සහ පැරණි ජල පොම්පය අලුත්වැඩියා කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). වැගපිටිය දන්ගස්වල මාර්ගයට පිවිසෙන ප්‍රධාන මංසන්ධියේ සිට බලංගොඩ දෙසට මීටර් 10 ක් දුරින් වම්පසින් ආරම්භවන මාර්ගයේ ගමන් කල හැකි වැගපිටිය ගම්මානයට පිවිසෙන මාර්ගය සමනල පෙදෙස නමින් නම් කිරීම සම්බන්ධයෙන් ගම්වාසින් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

එම මාර්ගය සමනල පෙදෙස ලෙස නම් කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව වැගපිටිය දන්ගස්වල මාර්ගයට පිවිසෙන ප්‍රධාන මංසන්ධියේ සිට බලන්ගොඩ දෙසට මීටර් 10 ක් දුරින් වම්පසින් ආරම්භවන මාර්ගයේ ගමන් කල හැකි වැගපිටිය ගම්මානයට පිවිසෙන මාර්ගය සමනල පෙදෙස ලෙස නම් කිරිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iii). නව ජල සම්බන්ධතා ලබා නොගැනීම හේතුවෙන් ඒ සඳහා ගෙවන ලද රු.7500.00 ක මුදල් ඒ.එම්. ඉන්ද්‍රාණි යසවතී මැණිකේ අංක 30, සඳුන්තැන්නගම, කරගස්තලාව, බෙලිහුල්ඔය (2021.10.08) සහ ඒ.එම්.සේනාරත්න, සඳුන්තැන්නගම,කගස්තලාව, බෙලිහුල්ඔය (2021.10.08.) යන ඉල්ලුම්කරුවන් වෙත ආපසු ගෙවිමට අදාල යෝජනාව යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

නව ජල සම්බන්ධතා ලබා නොගැනීම හේතුවෙන් ඒ සඳහා ගෙවන ලද රු.7500.00 ක ගාස්තුව ඉල්ලුම්කරුවන් දෙපල වෙත ආපසු ගෙවීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව නව ජල සම්බන්ධතා ලබා නොගැනීම හේතුවෙන් ඒ සඳහා ගෙවන ලද රු.7500.00 ක මුදල් ඒ.එම්. ඉන්ද්‍රාණි යසවතී මැණිකේ අංක 30, සඳුන්තැන්නගම, කරගස්තලාව, බෙලිහුල්ඔය (2021.10.08) සහ ඒ.එම්.සේනාරත්න, සඳුන්තැන්නගම,කගස්තලාව, බෙලිහුල්ඔය (2021.10.08.) යන ඉල්ලුම්කරුවන් වෙත ඔවුන්ගේ ඉල්ලීම පරිදි ආපසු ගෙවිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(iv). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට 2022 වර්ෂය සඳහා සැපයුම් හා සේවා ලබා ගැනීමට අදාල ව ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය අනුමතකරවා ගැනීමට අදාල වූ යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

2022 වර්ෂය සඳහා සැපයුම් හා සේවා ලබා ගැනීමට අදාල ව ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් එම යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 වර්ෂය සඳහා සැපයුම් හා සේවා ලබා ගැනීමට අදාල ව ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(v). තොටපල්ල උළුපිටිය පාර සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි මුදල් ඉල්ලීම අ.ග.පි. 440 අතිරේඛ 04 කොටපල්ල ගම අත්කර කරගත් ඉඩම්වල අයිතිය අවිනිශ්චිත ලෙස 10 (1) අ තීරණ නිකුත් කර ඇති අතර එයට වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කලයුතු බව දන්වමින්, ඒ සඳහා රු. 196,120/- (රුපියල් එක්ලක්ෂ අනුහයදහස් එකසිය විස්ස) ක මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත සභාව විසින් ගෙවන ලෙස දැනුම් දී ඇත. මෙම මාර්ගය පළාත් පාලන ආයතනයට අයත් මාර්ගයක් බැවින් එම වන්දි මුදල සභාව වෙතින් දැරිය යුතු වන අතර මෙම මුදල ගෙවීම සඳහා සභා අරමුදල් වෙන් කර නොමැත. මෙය සභාවට අයත් මාර්ගයක් වෙනුවෙන් දරන වියදමක් බැවින් පළාත් පාලන කොමසාරිස්තුමාගේ නිර්දේශය සහ ගරු ආණ්ඩකාරතුමාගේ පූර්ව අනුමැතියකින් අනතුරුව සභා අරමුදලින් ගෙවීම අනුමත කරවා ගැනීමට අදාල ව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තොටපල්ල ග්‍රාම නිලධාරි වසමේ තොටපල්ල උළුපිටිය මාර්ගය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු. 196120 /= ක වන්දි මුදල් ගෙවීමට පෙර ඒ පිළිබඳව තව දුරටත් කරුණු සොයා බලා ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතියට යටත් ව ගෙවීම සුදුසු බව ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තොටපල්ල ග්‍රාම නිලධාරි වසමේ තොටපල්ල උළුපිටිය මාර්ගය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු. 196120 /= ක වන්දි මුදල් ගෙවීමට පෙර ඒ පිළිබඳව තව දුරටත් කරුණු සොයා බලා ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතියට යටත් ව ගෙවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vi). 2021 වර්ෂයේ නොවැම්බර් මස රට විවෘත කලත් කොරෝනා මාර්ග උපදේශන නිසා හෝටල් සහ කෑම සපයන ස්ථාන විවෘත කිරිමට නොහැකි වු නිසාත්, දෙසැම්බර් මස සංචාරකයන්ගේ පැමිණිම අඩු වු නිසාත් බෙලිහුල්ඔය සංචාරක ගිමන්හල විවෘත නොකල බව සඳහන් කරමින් දෙසැම්බර් සහ නොවැම්බර් මාස සඳහා මාසික කුලිය අය නොකර, සහන සලසා දෙන ලෙසට නො 299, තොටගමපාර, හබරකඩ පී.කේ.එන්. ප්‍රියදර්ශන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

2021 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා බෙලිහුල්ඔය සංචාරක ගිමන්හලෙන් සභාවට අය කරගතයුතු මාසික කුලිය අයකිරිමකින් තොරව කපා හැරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව 2021 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා සභාවට අය කරගතයුතු මාසික කුලිය අයකිරිමකින් තොරව කපා හැරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

(06). (i). ගෙවීම අනුමත කිරීම.

- මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද දෙසැම්බර් මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 125 දක්වා සහ වවුචර් අනු අංක 1171 - 1308 දක්වා ගෙවීම් විස්තර වාර්තා වවුචර් උපලේඛන,
- දෙසැම්බර් මස මුදල් ගෙවීම සඳහා ඉදිරිපත් කරනු ලබන වවුචර් අනු අංක 01 – 13 දක්වා,
- 2021.12.31. දින මුදල් කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත් අනු අංක 01 – 06 දක්වා,
- 2021.12.31. වන දින මුදල් කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බිල්පත් අනු අංක 01 – 28 දක්වා,

2021.12.31. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් සභා සම්මත කර ගන්නා ලෙසට ගරු උප සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,

- 2021 දෙසැම්බර් මස 01 වන දින සිට 31 දින දක්වා ගෙවීම් විස්තර වාර්තා 2021.12.31. මුදල් කමිටුව සඳහා අනුමැතියට ඉදිරිපත් කිරිම යටතේ අනු අංක 03 – 06 ගැට්ටපාන දිය නාන තොටුපලට ඉහළින් කසල ගෙනත් දැමීම තහනම් යනුවෙන් STICKER බෝඩ් සැකසීම වෙනුවෙන් ගෙවීම යනුවෙන් එකම වර්ගයේ ගෙවීමක් පිළිබඳව අවස්ථා දෙකකදී සටහන් වී තිබෙනවා. ඊට හේතු දක්වන්න.
- මුදල් කමිටුවේ අනුමැතියට දෙසැම්බර් මස මුදල් ගෙවීම සඳහා ඉදිරිපත් කරනු ලබන වච්චර් අනු අංක 07, 08 - පෙර පාසල් කටයුතු සඳහා එකම ආකාරයේ මිලදී ගැනීමක් පිළිබඳව අවස්ථා දෙකකදී සටහන් කර තිබෙනවා. මෙවැනි මිලදී ගැනීම් එකවර සිදුකර එම බිල්පත් එකවර ගෙවීමට කටයුතු නොකරන්නේ ඇයි ?
- 2021.12.06. වන දින සහ 2021.12.10. වන දෙදින තුලදී ලක්මිණි මෝටර්ස් වෙතින් අනු අංක 24 සහ 26 යටතේ සටහන් කර ඇති LF – 6966 රථය අලුත්වැඩියා කර තිබෙනවා. එක දිනක් රු. 5550 ක මුදලකුත්, අනෙක් දින රු. 33190 කුත් ගෙවා තිබෙනවා. මෙම වාහනය පළමු දින අලුත්වැඩියා කිරීමේ දී පැවැති අඩුපාඩුව පිළිබඳව දනුවත් කරන්න තිබුණා. පළමු අවස්ථාවේ දී ම සේවා දෙකම එකවර සිදු කරවා ගැනීමට තිබුණා. එසේ නොකිරීමට හේතුව කුමක් ද ? පැහැදිලි කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,

- 2021 දෙසැම්බර් මස 01 වන දින සිට 31 දින දක්වා ගෙවීම් විස්තර වාර්තා 2021.12.31. මුදල් කමිටුව සඳහා අනුමැතියට ඉදිරිපත් කිරිම යටතේ අනු අංක 50 යටතේ කාර්යාලය සඳහා 2021.12.16. දින මාස්ක් 1000 ක් මිලදී ගැනිම සහ සබන් කැට 30 ක් මිලදී ගෙන තිබෙනවා. එමෙන්ම පසුගිය මාසයේ මුදල් කමිටුවට ඉදිරිපත් කරමින් මුදල් කමිටුවේ අනුමැතිය ලත් ලද වවුචර් වාර්තා තොරතුරු පසුගිය සභාවාරයට ඉදිරිපත් කිරීමේ දී ද සබන්කැට 56 ක් මිලදී ගෙන තිබෙනවා. මාස දෙකක් තුල සබන් කැට 86 ක් මිලදී ගැනීමට හේතු දක්වන්න.
- අනු අංක 04, 07 සහ 85 යටතේ කැපොක්වත්ත කසල අංගනයට වල්පැළ දියර නාශක අවස්ථා තුනක දී මිලදි ගෙන තිබෙනවා. එම මිලදී ගැනිම් සිදු කර ඇත්තේ එකම ස්ථානයකට සහ එකම සේවයකට බැවින් එකවර මිලදී ගැනීමට කටයුතු කිරිම සුදුසුයි.
- එමෙන්ම නාකැටියවත්ත, ඇල්ලේඅරාව ජල යෝජනා ක්‍රමයේ ජල පොම්පය සිව් වතාවක් අලුත්වැඩියා කිරීමට සිදු වෙලා. පළමු අවස්ථාවේ දී ම ජල පොම්පය අලුත්වැඩියා කිරීමේ දී රත්මලවින්න සුනිල් ගෝවින්න ආයතනයේ කාර්මික ශිල්පියා නැවත නැවත ජල පොම්පය අලුත්වැඩියා කර භාවිතා කිරීමේ නොහැකියාව පිළිබඳව නිවැරදිව සභාව දැනුවත් නොකිරීම නිසා සහ අරමුදල් අයතා ලෙස පරිහරනය සිදු වෙලා.

- එම නිසා සභා කාර්යාලයේ සේවය කරනු ලබන එක් නිලධාරියෙක් සභා අරමුදලින් ජිනසේන සමාගමේ පුහුණු වැඩසටහනකට යොමු කරන ලෙසට යෝජනා කරනවා. ඔහු ලබන පුහුණුව සේවයක් ලෙස සභාවට ලබා ගැනීමට හැකියාව පවතිනවා.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,
විමසන ලද වවුචර් විස්තර වාර්තාවන්ට අදාල සත්‍ය තොරතුරු ඊ ළඟ සභාවාරයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

ඒ අනුව මුදල් කමිටු අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

2021 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

## (08). වෙනත් කරුණු.

(i). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමියගේ ස්වාමි පුරුෂයා කොරෝනා වෛරසය ආසාධිතයෙක් ලෙස වාර්තා වීමත් සමඟ එතුමිටය ද නිරෝධානයට ලක්විය යුතු බව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් නිර්දේශ කර ඇති බැවින් අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව ලිපියක් මඟින් දැනුම් දී තිබෙනවා. එතුමියගේ නිවාඩු අනුමත කරන ලෙසට ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.
ඒ අනුව මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමියගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
තම ඉඩම් නාය යාමට ලක් ව ඇති ඉඩම් හිමිකරුවන්ට පදිංචිය සඳහා නව නිවසක් ඉදිකර ගැනිමට කැපොක්වත්ත ප්‍රදේශයෙන් ඉඩම් කොටසකුත් රු. ලක්ෂ 12 ක ණය මුදලකුත් ලබා දෙනවා. මේ අවස්ථාව වන විට රජයේ සේවකයන් දෙදෙනෙකුටත් තවත් ඉල්ලුම්කරුවන් සිව් දෙනෙකුටත් ඉඩම් සඳහා හිමිකම් ලබා තිබෙන අතර ඔවුන්ගේ නම ඉදිරිපත් වි තිබෙනවා. නාය යාමේ අවධානමට ලක්ව සිටින අනෙකුත් ජනතාවටත් ඉඩම් කොටස් සහ ණය මුදල් කඩිනමින් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට ක්‍රියා කරමු.
(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
ගොඩනැගිලි ඉදිකරන්නන් විසින් මාර්ග දෙපස ගොඩනැගිලි ඉදිකරන අවස්ථාවල් වලදී මාර්ග අවහිර වීම සිදුවන බැවින් ප්‍රාදේශීය සභාව මැදිහත් වී නිශ්චිත ගොඩනැගිලි සීමාව පිළිබඳව දැනුවත් කිරිමට පියවර ගනිමු.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
2021.11.16. වන දින මාසික මහ සභාව පැවැත්වුණා. එදින මා අසනීප තත්ත්වයෙන් පසු වූ බැවින් මාසික මහ සභාවට පැමිණියේ නැහැ. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා නිවාඩු අනුමත කිරීමේ යෝජනාව මාසික මහ සභාවට ඉදිරිපත් කල බව ප්‍රකාශ කරනවා. එහෙත් සභා වාර්තාවේ එම යෝජනාව සටහන් වි තිබුණේ නැහැ. මේ පිළිබඳව පළාත් සභාවෙන් පවා විමසා බැලුවා. මාසික මහ සභාවේ හඩපටිගත කිරිමේ යන්ත්‍රය පරීක්ෂා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,
නිවාඩු අනුමත කිරීමේ යෝජනාව සභා වාර්තාවේ සටහන් වි නොමැතිනම් ඊළඟ සභා වාරයේ දී ඒ පිළිබඳව සංශෝධනය ඉදිරිපත් කරන්න තිබුණා.

නැවතත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,

මා ඒ පිළිබඳව දැන සිටියේ නැහැ. එම නිසා මේ පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙස් ලබාගෙන මාසික දීමනාව, ඉන්ධන දිමනාව, දුරකතන දිමනාව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

(v). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
පුස්තකාලයේ පැවැති 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සහභාගී වුණා. වසර ගණනාවක් භාවිතයට නොගන්නා ආසියානු පදනමෙන් ලැබුණු භාවිතයට නොගන්නා ඉංග්‍රීසි පොත් පත්, පැරණි විෂය නිර්දේශයට අදාල මාස්ටර් ගයිඩ් පොත්පත් සහ අට්ලස්හෝල් පොත් පත් පුස්තකාලය තුල පවතිනවා. භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව ඒවා ඉවත් කිරිමට පියවර ගැනීම සුදුසු බව දන්වා සිටිනවා.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
2021.11.16. දින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අසනීප වී සිටින බව මා වෙත දැනුම් දුන් බැවින් මා විසින් එතුමාගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාව මාසික මහ සභාවට ඉදිරිපත් කළා. එහෙත් ඒ පිළිබඳව සභා වාර්තාවේ සටහන් වී නැහැ. එම අවස්ථාවේ දී ගරු සභාපතිතුමා විසින් එයා කොළඹ ගිහිල්ලානේ කියලා විහිළුවට මෙන් ප්‍රකාශ කළා. නමුත් එතුමන්ගේ නිවාඩු අනුමත වී නොමැති බැවින් හඬපටිගත කිරීමේ යන්ත්‍රය පරීක්ෂා කර බලා එතුමාගේ දීමනාව ගෙවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

(vii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා අදහස් දක්වමින්,
ඉන්ධන සහ දුරකතන දිමනා මන්ත්‍රීවරුන්ට හිමි වී ඇති වරප්‍රසාදයන්. ඒවා ලබා ගැනිම සඳහා බිල්පත් ඉදිරිපත් කරන ලෙස පෙර දැනුම් දී තිබීමෙන් මන්ත්‍රීවරුන් හැල්ලුවට ලක් වුණා. සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා එම තීරණය වෙනස් කිරීමත් සමඟ එම ගැටලුව විසඳුනා. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා 2021.11.16. වන දින පැවැති මාසික මහ සභාවට නොපැමිණිම වෙනුවෙන් එතුමාට හිමි දීමනා ගෙවා නැති බව එතුමා ප්‍රකාශ කළා. වසර විස්සක් පමණ මේ සභාවේ සේවය කළත් මෙවැනි සිදු වීමක් මේ වන තුරු සිදු වී නැහැ. බලංගොඩ නගර සභාව සහ බලංගොඩ ප්‍රාදේශීය සභාව තුල මෙවැනි සිදුවීම් සිදු වී නැති බව ඔවුන් ප්‍රකාශ කරනවා. මම එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කලත් දැනට සමගි ජනබලවේගය පක්ෂය වෙනුවෙන් පෙනී සිටිනවා. මා විපක්ෂ නායකයා ලෙස සඳහන් කලත්, ප්‍රාදේශීය සභාව තුල විපක්ෂ නායක තනතුරක් නැහැ. වැඩකටයුතු වල පහසුව සඳහා එසේ පත්කර තිබෙනවා. විපක්ෂ නායකයා ලෙස මන්ත්‍රී වරප්‍රසාද වෙනුවෙන් පෙනී සිටිනවා. එතුමාගේ දීමනාව ලබා දිය යුතුය යන මතයේ මා සිටිනවා. ලේකම්තුමිය පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙස් විමසා බලා ගැටලුව විසඳා දීමනාව ගෙවීමට කටයුතු කරන්න. මන්ත්‍රී වරප්‍රසාද ලබා ගැනීම වෙනුවෙන් අප සියලුදෙනා එක් මතයක සිටිනවා. එකම කොට්ඨාසය නියෝජනය කරන ගරු සභාපතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අතර පෞද්ගලික දේශපාලන මතභේදයක් පවතින බව දක්නට තිබෙනවා. එම ගැටලුව සභාවේ සභා කටයුතු වලට බාධාවක් බැවින් පක්ෂ මන්ත්‍රී කණ්ඩායම් රැස්වීමක දී මෙම ගැටලුව විසඳා ගැනීමට කටයුතු කිරිම සුදුසු බවට යෝජනා කරනවා. සභා ගර්භය විවෘත කිරිමට පළාත් පාලන කොමසාරිස්තුමා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට පැමිණි අවස්ථාවේ දී අනෙකුත් සභාවල් වල නොයෙකුත් ගැටලු පවතින බැවින්, වැදගත් සභාවක් ලෙසත් ප්‍රදේශයේ ජනතාවට ආදර්ශමත් සහ වැඩදායි සභාවක් ලෙස කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කලා.
රට තුල ඉදිරි කාලය තුල ආහාර අර්බුධයක් මතුවන බව කෘෂි කර්මය පිළිබඳව හසල බුද්ධියක් තිබෙන විද්වතුන් ප්‍රකාශ කලා. රජයේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ රක්ෂිත කොටස් නොවන එහෙත් ලඳු කැළෑ භාවිතයට ගෙන ආහාරයට ගැනීමට හැකිවන මඤ්ඤොක්කා වැනි දේවල් වගා කිරිමට ජනතාවට අවකාශය ලබා දීමට පියවර ගැනීම සුදුසුයි. එහෙත් මෙවැනි අවස්ථාවල් වලදී වසම්භාර ග්‍රාම නිලධාරින් ප්‍රාදේශීය ලේකම්ගේ බලයට එහා ගිය බලයක් තුලින් ක්‍රියා කර ඒවා ගලවා විසිකිරීමට ක්‍රියා කරනවා දැක තිබෙනවා. ලංකා භූමියේ වගා කිරීමෙන් පල ලබන්න හැකි බැවින් මේ සඳහා ජනතාවට නිලධාරි අධීක්ෂණය යටතේ අවස්ථාව ලබා දීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
නායයාම් වලට ලක්ව ඇති ඉඩම්හිමිකරුවන් සඳහා ඉඩම් ලබා දීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
මාර්ග දෙපස ගොඩනැගිලි ඉදි කිරීමේ දී බිම්කට්ටි සැලසුම් අනුමත කිරීමේ කමිටුවට යෝජනා ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දැක්වීම අනුව,
නිවාඩු අනුමත කිරීමේ යෝජනාව පිළිබඳව දැන ගැනීම සඳහා හඬ පටයට සවන් දීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ. සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දැක්වීම අනුව,
භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව සුදුසු ඉදිරි කටයුතු කිරිම සුදුසුයි. එහෙත් පැරණි පොත් පත් ආරක්ෂිතව තබා ගැනීමට කටයුතු කල යුතුයි.

(09). ඊ ළඟ සභා වාරයට දින නියම කිරීම.
2022 පෙබරවාරි මස 08 වන අඟහරුවාදා දින ඊ ළඟ මහ සභාව පැවැත්වෙනවා.

(10). ස්තූති කතාව හා අවසානය.
හත්වන සභාවේ හතළිස් හත්වන සභාව සඳහා පැමිණි ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, මාධ්‍ය වේදී මහතුන් සියළු දෙනාටත්, ලේකම් තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත් මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

ඉන් අනතුරුව, පෙ.ව. 11.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.